ගැමි නැණ නුවණ - 10

# කළ හොඳ පස්සෙන් එළවනවා

(c) Sumitha Publishers

කියා දෙන්නේ

**ජේ. බී. දිසානායක**

චිත්‍ර ඇන්දේ

**ප්‍රගීත් අබේධීර**

ඔන්න එකෝමත් එක රටක කැලෑවක් අද්දර ගමක
ගමරාල කෙනෙක් ජීවත් වුණා.
තමාගෙ ගෙයි වහලෙ ලී දඬු
ටිකින් ටික දිරා පත් වී
තිබෙන බව දවසක් දා
ගමරාල දැක්කා.
අලුතින් ලී දඬු දමන්ට
කල් බව
ගම හාමිනේත් කීවා.



(c) Sumitha Publishers



(c) Sumitha Publishers


(c) Sumitha Publishers

දවසක් උදේ පාන්දරින්ම
බත් ගෙඩියකුත් බැඳ ගෙන
කැත්තකුත් කර තියා ගෙන
ගමරාල කැලෑවට ගියා
ලී දඬු කපා ගන්ට.



(c) Sumitha Publishers



(c) Sumitha Publishers

හොඳ හොඳ ලී දඬු හොයා
ඒ පැත්තටත් මේ පැත්තටත් යන කොට
ගමරාලට පාර හොයා ගන්ට බැරුව ගියා.
ගමරාල හොඳටෝම මංමුළා වෙච්චි!
‘දැන් ඉතින් කාට කියන්ට ද?’
කියලා හිත හිතා ඉන්න කොට
ඔන්න බොලේ නරියෙක් ආපි ඒ පැත්තට!



(c) Sumitha Publishers